# ආර්ථික සැලසුම්කරණය (Economic Planning)

## 1.1 ආර්ථික සැලසුම්කරණය යනු කුමක්ද ?

ආර්ථික සැලසුම්කරණය යනු රටක නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සම්පත් බෙදාහැරීමේ යාන්ත්‍රනය ලෙස සැලකෙන අතර එය වෙළෙඳපොළ යාන්ත්‍රණයට විකල්ප ක්‍රමයක් වශයෙන් සැලකේ. ආර්ථික සැලැස්මක් රටක මූලික ආර්ථික කටයුතු, ආර්ථික ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් දුවන ආකාරය පෙන්නුම් කරන ලේඛනයක් ලෙස හැඳින්විය හැක. ඒ අනුව කුමක්, කෙසේ, කා සඳහා නිපදවන්නේද යන මූලික ආර්ථික ප්‍රශ්න විසඳන ආකාරය ඉන් පැහැදිලි කෙරේ. මධ්‍යගත සැලසුම් ක්‍රමය මත ක්‍රියාත්මක වූ සමාජවාදී රටවල් සිය ආර්ථිකයන් කළමනාකරණය සඳහා ඉදිරිපත් කළ වැඩසටහන හෝ සැලැස්ම ආර්ථික සැලසුම් ලෙස භාවිතා කල අතර එය අදෘශ්‍යමාන වෙළෙඳපල බළවේග මගින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳන නිදහස් වෙළඳපල ක්‍රමයට ප්‍රතිවිරුද්ධ ක්‍රමය විය. බ්‍රිතාන්‍ය විශ්වකෝෂයට අනුව සැලසුම්කරනය අර්ථ දක්වා ඇත්තේ, **“මධ්‍යම ආණ්ඩුව මගින් ආර්ථිකයේ ප්‍රධාන තීරණ ගැනීම හෝ ඒ සඳහා බලපෑම් කිරීම ලෙසය.** ඒ අනුව **එය රාජ්‍ය නිර්බාධවාදී ප්‍රතිපත්තිය** වන අවම රාජ්‍ය මැදිහත්වීම් සහිත තරඟකාරී වෙළෙඳපල ක්‍රමයට **ප්‍රතිවිරුද්ධ වේ.”** සැළසුම්කරණය **යටතේ** රටක ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දිශාව, වේගය හා පරමාර්ථ ආණ්ඩුව මගින් තීරණය කරනු ලැබේ. මෙම අර්ථ දැක්වීමට අනුව ආර්ථික සැලසුම්කරණය යනු රාජ්‍ය මැදිහත්වීම මත සිදුවන ක්‍රියාවලියක් වුවත් වෙළඳපල අර්ථක්‍රමය ක්‍රියාත්මක කරන රටවල් ද සිය ආර්ථික කටයුතු සැලසුම් මඟින් සිදු කරනුලැබේ. බොහෝ මිශ්‍ර ආර්ථික ක්‍රම ක්‍රියාත්මක වන රටවල් විසින් ද ආර්ථික සංවර්ධන ක්‍රමෝපායක් ලෙස සැළසුම්කරණය භාවිතා කෙරේ.

ආර්ථික සැළසුම්කරණය සමස්ත ආර්ථිකය පදනම් කොට සිදුකරන සංකීර්ණ හා පුළුල් ක්‍රියාවලියකි. එනම් රටේ ජාතික නිෂ්පාදනය ඉදිරි කාල වකවානුව සඳහා කළමණාකරණය කිරීමකී. ජාතික නිෂ්පාදිතය යනු රටක් දේශීය වශයෙන් හෝ විදේශිය සහභාගිත්වය ඇතුව සිදු කරනු ලබන නිෂ්පාදනය හෝ ආදායම් උත්පාදන ක්‍රියාවලියක් ලෙස සැලකුවහොත් මූලිකවම එයට රට තුළ සිදුකරන කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශවල නිෂ්පාදන මෙන්ම රටේ ජනතාව විදේශවල සිදු කරන සේවාවලින් ලබා ගන්නා ආදායම් මෙන්ම, විදේශිකයන් දේශිය ආර්ථිකය තුළ සිදු කරන ආර්ථික ක්‍රියා වලින් ද ඇතුළත්ය. මේ නිසා සැලසුම්කරනයෙන් සිදුවන්නේ සමස්ථ ආර්ථික අරමුණු වන ආර්ථික වර්ධනය, මිල ස්ථායිතාවය හා සේවා **නියුත්තිය** පිළිබඳ කටයුතු **නිශ්චිත**

**පරමාර්ථ හා ඉලක්ක මත සිදුකිරීමකි**. එනම් සමස්ත ආර්ථික සැලැස්මකින් අපේක්ෂා කරන්නේ රටේ සම්පත් කාර්යක්ෂමව යෙදවීම සඳහා කටයුතු කිරීමයි. මේ අනුව මධ්‍යගත ආර්ථික සැලැස්මක් මඟින් ඉදිරි කාලසීමාවක් සඳහා එනම් වසර 05 ක හෝ 10 ක කාලසීමාවක් තුල රජයක් විසින් මහජන සුභසාදනය සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති, ක්‍රියාකාරකම්, උප ක්‍රියාකාරකම් හා ඉලක්ක පෙන්නුම් කරයි.

1. සැලසුම් පද්ධති

**දැනට ක්‍රියාත්මක වන සැලසුම් පද්ධතිවල ස්වරූපය ලොව ක්‍රියාත්මක වන ආර්ථික පද්ධති අනුව වෙනස්වේ. ඒ අනුව කුමක් කෙසේ කා සඳහා ද යන ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා අනුගමනය කරන** ප්‍රධාන ආර්ථික චින්තන ක්‍රම වන මාර්ක්ස්වාදී සැලසුම් ක්‍රමය, වෙළෙඳපොළ හෝ ධනවාදී ක්‍රමය හා එම ක්‍රම දෙකම් මත පදනම් වූ මිශ්‍ර ආර්ථික චින්තනය අනුව ක්‍රියාත්මක වන සැලසුම් පද්ධති **හඳුනාගත හැක.**

## 1.1 මධ්‍යගත **සැලසුම් (Centralized Planning)**

විධාන හෝ සැලසුම් ආර්ථික පද්ධති යටතේ බලය පැවරුණු එකාධිපති පුද්ගලයෙක් හෝ පුද්ගලයන් කීපදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක වන මාර්ක්ස්වාදී සැලසුම් මීට අයත්වේ. මධ්‍යගත සැලසුම් ක්‍රියාවලියට අනුව මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා මධ්‍යගත **සැලසුම් සැලසුම් මණ්ඩලයක් විසින් නිස්චිත කාලසීමාවක් සඳහා ඉහල සිට පහලට ක්‍රියාත්මක කරන සැලසුම්** මධ්‍යගත **සැලසුම් වේ. වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයට ප්‍රතිවිරුද්ධ** මධ්‍යගත **සැලසුම් ක්‍රමයේ මූලික පරමාර්ථය වන්නේ අතිරික්ත නිෂ්පාදනය පාලනය කිරීම වන අතර එය සමාජයේ භාවිත වටිනාකම (**use-value) **මත තීරනයවේ.**

මර්ක්ස්වාදී හා සමාජවාදී රටවල් විසින් ක්‍රියාත්මක කරනු ලබන දිගුකාලීන හෝ කෙටිකාලින සවර්ධන සැලසුම් මෙයට උදාහරණ වශයෙන් දැක්විය හැක. රාජ්‍ය නායකයින්ගෙන් හා

විශේෂඥයන්ගෙන් සමන්විත සැලසුම් මණ්ඩලයක් හෝ අධිකාරියක් යටතේ මධ්‍යගත සැලසුම් ක්‍රියාත්මක කෙරෙන අතර එය විධාන ස්වරුපයෙන් ක්‍රියාත්මකවේ. ලෙනින් සහ ජෝසෆ් ස්ටාලින් සමවලදී රුසියාවේ ක්‍රියාත්මක කල සැලසුම් මෙන්ම චීනය මා වෝ සේතුන්ග් පාලන කාලයේදී චීනයේ ක්‍රියාත්මක කල සලසුම් මීට උදාහරණ වේ. භොතික සැලසුම්කරණය ලෙස ද මෙය හැඳින්වේ.

## 1. 2. වෙළෙඳපොළ (ධනවාදී ) සංවර්ධන සැලසුම්

**වෙළෙඳපොළ (ධනවාදී )** හෝ ලිබරල්වාදී ආර්ථික පද්ධති යටතේ ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන සැලැස්මක මූලික ලක්ෂණය වන්නේ රාජ්‍ය ක්‍රියාකාරිත්වය අඩුකොට පුද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වය වැඩිවන පරිදි ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීමයි. ඒ අනුව කුමක් , කෙසේ කා සඳහා ද යන මූලික ආර්ථික ප්‍රශ්න නිදසස් වෙළෙඳපොළ යටතේ ක්‍රියාත්මක මිල යාන්ත්‍රනය මගින් අදෘශ්‍යමාන හස්තයකින් ඉබේම විසඳීමට පියවර ගන්නා අතර ඒකාධිකාරී තත්වයන් පාලනය කිරීම හා පොදුසේවා සවයීම සඳහා රජය මැදිහත්වේ. ඒ අනුව ආර්ථික හා සංවර්ධන අරමුණු මත රජය විසින් අපේක්ෂිත සංවර්ධන ක්‍රියාවලිය නිශ්චිත කාලසීමාවක් තුල ඉලක්ක සහ වැඩසටහන් අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් ඉදිරිපත් කෙරෙන අතර එය රාජ්‍යය හා පුද්ගලික දෙඅංශයේම ක්‍රියාකාරීත්වයෙන් ක්‍රියාත්මක කෙරේ . දෙවන ලෝක යුද්ධයෙන් පසුව ප්‍රංශය හා ජර්මනිය නැවත ගොඩනැගීමේදී මෙම ක්‍රමය හඳුන්වා දුන් අතර වර්තමානයේදී බොහෝ සංවර්ධිත රටවල් විසින් මෙම ක්‍රමය අනුගමනය කරනු ලැබේ. අන්තර් කර්මාන්ත ආකෘතිය යටතේ බහු ජාතික සමායතන මගින් ලිබරල් ක්‍රමය යටතේ සැලසුම් ක්‍රියාත්මක කෙරේ.

## 1.3 මිශ්‍ර ආර්ථික සැලසුම්

වෙළෙඳපොළ (ලිබරල්) හා මාක්ස්වාදී **මතවාද දෙකම පදනම් කරගත්** මිශ්‍ර ආර්ථික පද්ධති වර්තමානයේදී" ක්‍රියාත්මක වන අතර එය මිශ්‍ර සංවර්ධන සැලසුම් වශයෙන් හැඳින්වේ. එයට

**රාජ්‍ය සහ පුද්ගලික අංශ සැලසුම් Public and private sector Planning මෙන්ම** මධ්‍යගත හා විමධ්‍යගත සැලසුම් (**Decentralized planning) අයත්වේ.**


ඉහත සඳහන් කල විවිධ සැලසුම් පද්ධති වන සැලසුම් හෝ විධාන සැලසුම් ක්‍රම ක්‍රියාත්මක කල රටවල් වශයෙන් රුසියාව හා චීනය සඳහන් කල හැකිය. පස් අවුරුදු කාලසීමාවක් සඳහා මධ්‍යගත සැලසුම් මණ්ඩලයකින් මෙම සැලසුම් ක්‍රියාවට නංවා ඇත. වෙළෙඳපොළ ආර්ථික සැලසුම් පද්ධති වලට උදාහරණ වශයෙන් එංගලන්තය, එක්සත් ජනපදය සඳහන් කල හැකිය. වෙළෙඳපොළ යාන්ත්‍රනය ක්‍රියාත්මක කරන ගමන් රජය විසින් තෝරා ගත් අංශ හා ඉලක්ක සඳහා භෞතික සැලසුම් ඉදිරිපත්කිරීම මෙමගින් සිදුවේ. එය indicative planning හඳුන්වයි. මිශ්‍ර ආර්ථික සැලසුම් යනු රාජ්‍ය මැදිහත්වීම හා මිල යන්ත්‍රනය දෙකම් පදනම් කරගෙන සිදු කරනු ලබන සැලසුම්ය. වර්තමාන ලෝකයේ වැඩියෙන්ම ක්‍රියාත්මක වන්නේ මිශ්‍ර සැලසුම් වන අතර රාජ්‍ය අංශයේ හෝ පුද්ගලික අංශයේ මැදිහත්වීමේ ප්‍රමානය /ප්‍රතිසතය එම රටවල ක්‍රියාත්මකවන දේශපාලන දර්ශනය මත තීරනයවේ. උදාහරණ වශයෙන් ජර්මනියේ හා ප්‍රනශය් ක්‍රියාත්මක වන සමාජ් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය මගින් වෙළෙඳ පොළ සමග රාජ්‍ය සුභසාදනය සැලසුම් කර ඇත. එසේම සැලසුම් කල රාජ්‍ය ව්‍යාපාර හා පුද්ගලික ව්‍යාපාර ක්‍රමවේදයක් මැලෙසියාව හා සිංගප්පුරුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## 2 ආශීය **සැළසුම්**

**ආර්ථිකයක එක** අශයක් පමණක් ඉලක්ක කරගෙන එම අංශය සඳහා වෙනම සැලැස්මක් පිළියෙළ කිරීම් ආශීය සැළසුම් ලෙස සරලව අර්ථ දැක්විය හැක. ඒ අනුව කෘෂිකාර්මික **අංශය සඳහා සකස් කරන සැලැස්මක්** කෘෂි ආශීය සැළස්ම ලෙස සැලකේ. සැලැස්මක මූලික අංගයන් වන දැක්ම, මෙහෙවර, අරමුණු, ක්‍රමෝපායන් හා වැඩසටහන් මගින් අපේක්ෂා කරන්නේ සීමිත ආර්ථික සම්පත් ප්‍රශස්ත මට්ටමින් මහජන සුභසාධනය සඳහා උපයෝජනය කිරීමයි. කිසියම් ක්‍රමවේදයක් මත ආර්ථිකයක් හැසිරවීමෙන් සෘණ බාහිරතා අවම කළහැකි අතර භෞතික හා සමාජ ආර්ථික වෙනස්කම් මෙන්ම ගොලීය අසමතුලිතතාවයන්ට මුහුණු දීමට හෝ අභියෝග ජයගැනීමටද පහසුවනු ඇත. කෙසේ නමුත් සාර්ව ආර්ථික සැලසුම්කරණය සංකීර්ණ ක්‍රියාවලියක් බැවින්

කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශ සඳහා වෙනම සැලසුම් සකස්කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන් අපේක්ෂා කරනු ලැබේ. මින් අපේක්ෂා කරන්නේ ඉහත කී අංශවලට අදාල ගැටළු හා ප්‍රමුඛතා හදුනාගෙන ඒ සඳහා සුවිශේෂී අරමුණු සහිත සැලසුම් සකස් කිරීමයි. එමඟින් අදාල අංශවල නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩිකිරීම, සේවා වියුක්තිය අවම කිරීම මෙන්ම සමාජ සුභසාධනය වැඩිකිරීමට ද හැකි වේ.

සාර්ව ආර්ථික සැලැස්මක් කෘෂිකාර්මික ආංශික සැලැස්මකට සම්බන්ධ වන ආකාරය පහත දැක්වේ. එවැනි ආංශික සැලැස්මක උප අංශ සැලසුම් රාශියක් දැකිය හකි අතර එම ආංශික සැලසුම් සියල්ලම එක් කෘෂිකාර්මික සැලැස්මක් තුළින් ක්‍රියාත්මක විය යුතු වේ. එලෙස ජාතික, ආංශික, උප ආංශික හා අනු ආංශික වශයෙන් සැලසුම් සකස්වන ආකාරය පහත දැක්වේ.




මෙම ජාල සටහනට අනුව මූලික වශයෙන් කෘෂිකාර්මික සැලැස්මක් ජාතික සංවර්ධන සැලැස්මක උප කොටසක් ලෙස හැඳින්විය හැක. ඒ අනුව එකී කෘෂි කාර්මික සංවර්ධන සැලැස්ම තවත් ආංශික, උප ආංශික හා අනු ආංශික සැලසුම් ගණනාවකින් සමන්විත විය හැක. සමස්ත සංවර්ධන සැලැසුම ක්‍රියාත්මක වන විට ඉහත සඳහන් කරන ආකාරයේ උප සංවර්ධන සැලසුම් ද ක්‍රියාත්මක විය යුතුය.

## 3. සැලසුම් ක්‍රමයක අවශ්‍යතාවය

පහත සඳහන් අවශ්‍යතා මත ආර්ථික සැලසුම් සකස් කෙරේ.

1. වෙළෙඳපොළ බිඳ වැටීමේ තර්කය (Market failure argument)

2. සම්පත් බෙදාහැරීමේ තර්කය (Resource allocation argument)

3. විදේශ ආධාර බෙදාහැරීමේ තර්කය (Foreign aid allocation argument)

4. ආකල්ප හා මනෝ විද්‍යාත්මක තර්කය (Attitudinal and Psychological argument)

**සැලසුම් වර්ග**

ප්‍රධාන වශයෙන් සැලසුම් වර්ග 5 ක් පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත (Healey,1994).

I. ආර්ථික සැලසුම් (Economic Planning)
II. භෞතික සැලසුම් (Physical Planning)
III. ප්‍රතිපත්ති විශ්ලේෂණ සැලසුම් (Policy Analysis and Planning)
IV. අර්ථදැක්වීම්/ සන්නිවේදන සැලසුම් (Interpretative Communicative planning)
V. සහයෝගිතා සැලසුම් (Collaborative Planning)

4. සැලසුම් මාධ්‍ය(**Modes of Planning**)

සැලසුම් මාධ්‍ය යනු සැලසුම් කරන පිළිවෙල හෝ සැලසුම් ක්‍රමවේදයයි. සැලැස්මක් ක්‍රියාවට නැංවීමේදී පිළිවෙලින් අනුගමනය කරන ක්‍රමවේදය ඊට අයත්වන අතර ඒ අනුව සැලැස්මේ හෝ ව්‍යාපෘතියේ අවසන් ඵලය ඉටු කරගන්නා ආකාරය සැලසුම් මාධ්‍ය මගින් පෙන්නුම් කෙරේ. ඊට ගැටළු අධ්‍යනය, පැවතිය හැකි විකල්ප අවස්ථා හා සීමා සැලකිල්ලට ගැනීම, වග වූ කාර්යභාරයේ අපේක්ෂිත ඵල ඉෂ්ට කරගනීම, කාල රාමුව හා කාර්යයන්වල කාලය නිර්ණය කිරීම වැනි ක්‍රියාවලි අයත්වේ. මෙහිදී අවධානය යොමු කලයුතු ප්‍රධාන අංග කීපයකි. අපේක්ෂිත ඵලය, අරමුණු (Objectives), ක්‍රමෝපායන් (Strategy), කාර්යයන්, යෙදවුම් හා නිමවුම්, කාල රාමුව හා අය වැය ලේඛනය ඊට අයත්වේ. සීමිත සම්පත් අවම පිරිවැයකින් නිශ්චිත කාල රාමුවක් තුල කළමනාකරණය කිරීමට මින් අපේක්ෂා කෙරේ.

මාධ්‍ය හා අවසන්ඵල විශ්ලේෂණය **Means and End Analysis**

එසේම සැලැස්මක් හෝ ව්යාපෘතියක් සකස් කිරීමේදී එහි මාධ්‍ය හා අවසන් ඵලය අතර සබඳතාවය පැහැදිලිව හඳුනා ගත යුතුය. මින් අපේක්ෂා කරන්නේ සැලැස්මේ අවසන්

ප්‍රතිඵලය හා එය ඉටුකරගැනීමට අනුගමනය කරනු ලබන ක්‍රමෝපායන් අතර සබඳතාවය පැහැදිලිව හඳුනා ගැනීමයි. **උදා -** කල්පිත කෘෂිකාර්මික සැලැස්මක අපේක්ෂිත **අවසන් ප්‍රතිඵලය සහලින් රට ස්වයංපෝෂිත කිරීම** වේ. **අධි ඵලදායි බිජ වර්ග ශඳුන්වාදීම මෙහි** ක්‍රමෝපාය **විය හැකිය.** ඒ සඳහා භාවිතා කරන ප්‍රතිපත්ති හා ප්‍රතිපත්ති මෙවලම් ද ඊට අයත්වේ.

| | |
|---|---|
| **අවසන්** ඵලය / **අරමුණ** | **සහලින් රට ස්වයංපෝෂිත කිරීම** |
| Objective (end) | Self sufficiency in rice |
| | ↓ |
| **ක්‍රමෝපාය** | **අධි ඵලදායි** බීජ භාවිතය වැඩිකිරීම |
| Starategy | A high yielding varieties |
| (means / මාධ්‍ය) | |
| | ↓ |
| **ප්‍රතිපත්ති** | **පොහොර සහනාධාරයක් ලබාදීම.** |
| Policy | Fartilizer subsity policy |
| (means/ මාධ්‍ය) | |
| | ↓ |
| **ප්‍රතිපත්ති මෙවළම** | **ගොවි සමුප්කාර / ගොවිජන සේවා මධ්‍යස්ථාන** |
| Policy Instrument | cooperatives / Agrarin service |
| (means / මාධ්‍ය) | |

මේ සඳහා පෙහොර සහනාධාරයෙන් ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපත්ති සකස් කළ හැකි අතර ප්‍රතිපත්ති උපාය වශයෙන් ගොවි සමුපකාර ක්‍රම ක්‍රියාත්මක කිරීම හෝ ගොවිජන සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම සිදු කළ හැක.

අරමුණු සකස් කිරීමේදී සැලකිල්ලට ගත යුතු තවත් කරුණක් වන්නේ අරමුණු, කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් වෙන්ව කිරීමයි. සැලැස්ම අවරුදු 10 කාලසීමාවකට සකස්කර ඇත්තේ මේ සැලැස්ම අවසානයේදී අපේක්ෂිත ඵලයන් ලබාගැනීම දිගුකාලීන අරමුණු වුවත් කෙටිකාලයේදී සහ මධ්‍ය කාලයේදී එම අරමුණු ඉටුවන පරිදි වෙනත් සුවිශේෂි අරමුණු ක්‍රියාවට නැංවිය හැක.

**සැලසුම් ක්‍රමය පිලිබඳ විවේචන**

සැලසුම් ක්‍රමයේ න්‍යායාත්මක පසුබිම පිලිබඳව විවේචනය කරන Friedrich Hayek and Ludwig von Mises පෙන්වා දෙන්නේ මධ්‍යගත සැලසුම් ක්‍රමය මූලික ආර්ථික ප්‍රශ්න පිළිබඳව සන්වේදී නොවන බවයි. එසේම එම ක්‍රමය ප්‍රායෝගික නොමැති බවත් එමගින් පුද්ගල අපේක්ෂාවන් හෙළි නොවන බවත් ප්‍රකාශ කරයි .

## දෙවන සැසිය


## ක්‍රමෝපායික සැලසුම් (Strategic Planning)

**ක්‍රමෝපායික සැලසුම් යනු ආයතනයක අපේක්ෂිත** දැක්ම, එහි **ඵලය** හා එය ඉටු කරගැනීම සඳහා පවත්නා පරිසරය ගලපා ගැනීම සඳහා කරන මැදිහත්වීමකි. එනම් නායකත්වය හා කළමානාකරණය මගින් ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීම

සඳහා ක්‍රමොපායිකව භාවිතාකරන චක්‍රීය මෙවලමකි. ඒ අනුව නායකත්වය, පාර්ශවකරුවන් හා ශ්‍රමිකයන්ගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වන චක්‍රීය **ක්‍රමෝපායික** සැලසුම් ක්‍රියාවලිය අංග 6 කින් යුක්තය ((http://lynnecarbone.com/strategic-planning,2019).

.

2.1: **ක්‍රමෝපායික සැලසුම් චක්‍රය**
Strategic Planning Cycle




ඉහත වගුවෙන් දැක්වෙන පර ... කට සම්බන්ධ හා සහයෝගිතාවයෙන් ක්‍රියාත්මක වන **ක්‍රමෝපායික සැලසුම්** ක්‍රියාවලිය කොටස් 6 කින් යුත්තය.

1. ගෝලීය පරිසරය හා මතුවෙමින් පවත්නා ප්‍රවණතා හඳුනාගනීම.

2. ශක්තිය, හොඳ අවස්ථා, දුර්වලතා සහ තර්ජන හඳුනාගනීම.

3. ආයතනයේ දැක්මේ සහ මෙහෙවරේ වලංගුතාවය තහවරුකිරීම හා අලුත්කිරීම

4. අරමුණු, ක්රමෝපායන් සහ කාර්යයන් සැකසීම

5. ක්රියාත්මක කිරීම හා කළමනාකරණය කිරීම

6. ඇගයීම සහ අවශ්ය ගැලපුම් සිදුකිරීම .


**ක්රමෝපායික සැලසුම්** ක්රියාවලිය කණ්ඩායම් ගතිකත්වයෙන් යුත් සැලසුම් ක්රමයක් වන අතර එය බුද්ධි කලම්බන, සාකච්චා හා ඇගයීම් වලින් සමන්විත ගැටළු නිරාකරණය කරන ක්රමයකි. මෙලෙස කිසියම් ආයතනක් සිය පාර්ශවකරුවන්ගේ සහාගිත්වයෙන් සකස් කරනු ලබන ක්රමෝපායික සැලැස්මක් එම ආයතනයේ ඉදිරි කටයුතු සිදු කරනු ලබන ආකාරය පෙන්නුම් කරනු ලබන මාර්ග සිතියමක් ලෙස සැලකිය හැකි බව පෙන්නුම් කර ඇත. ((http://lynnecarbone.com/strategic-planning,2019). එසේම **ක්රමෝපායික සැලසුම් සකස් කිරීමේ සංකල්පීය පදනම** ත්රිකෝණ කරණය මගින් විස්තර කරාත.

2 ත්රිකෝණ කරණය

**ක්රජ් අනුව මෝපායික සැලසුම්වල සංකල්පීය පදනම අනාගත අපේක්ෂාවන්, හැකියාවන්, අවස්ථාවන් හා සීමාවන් සැලකිල්ලට ගෙන හොඳම ගැලපීම තීරණය කරන** ත්රිකෝණ කරණ ක්රියාවලියක් ලෙස සැලකේ.

Fig 2.2 : Triangulation of Main Concepts- සංකල්ප ත්රිකෝණ කරණය

Intension (**අනාගත අපේක්ෂාවන්** )




Capabilities (හැකියාවන්) Context (සංධර්භය)

**අනාගත අපේක්ෂාවන්** ( Intension): ව්යාපෘතියෙන් අපේක්ෂිත අවසන් ඵලය ඉතා පැහැදිලි දැක්මක් සහිතව ඉදිරිපත් කරන ප්රකාශයකි.

හැකියාවන් (Capabilities) යනු සම්පත්, ආයතනයේ ශක්තිය හා දුර්වලතා සැලකිල්ලට ගැනීමයි.

සංධර්භය (Context) යනු අනාගත විභවතාවන්, සීමාවන් හා තර්ජන සැලකිල්ලට ගැනීමයි

මෙම සාධක තුන මනා ලෙස ගැලපීම හෙවත් ත්‍රිකෝණ කරණය කිරීම **ක්‍රමෝපායික සැලසුම් ලෙස අර්ථ දැක්වේ.**

## පාර්ශවකරුවන් පිලිබඳ විශ්ලේෂණය (**Stakeholder Analysis**)

පාර්ශවකරුවන් පිලිබඳ විශ්ලේෂණය **ක්‍රමෝපායික සැලසුම් සකස් කිරීමේදී අනිවාර්ය අවශ්‍යතාවයකි. ව්‍යාපෘතියක පාර්ශවකරුවන් යනු අබයන්තර හා බාහිර වශයෙන් සම්බන්ධවී සිටින සියලුම සේවාදායකයන් ලෙස සැලකිය හැක. එයට ප්‍රතිලාභීන්, අරමුදල් සපයන ආයතන, කාර්යමණ්ඩලය, සහාය කාර්යමණ්ඩලය, උපදේශක වරුන්, සේවා ආයතන හා** අනෙකුත් රාජ්‍ය/ රාජ්‍ය නොවන ආයතන අයත්වේ. පාර්ශවකරුවන් පිලිබඳ විශ්ලේෂණයෙදී පහත සඳහන් කරුණු ගැන අවධානය යොමු කලයුතුය .

1. ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක්වන පිරිස් පිළිබඳව විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් සොයා බැලීම.

2. පාර්ශවකරුවන් වර්ග කිරීම

3. පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා හා කැමැත්ත සොයා බැලීම

4. ප්‍රමුඛතා අනුව අවශ්‍යතා හා කැමැත්ත පෙළගැස්වීම.

5. අවශ්‍යතා හා කැමැත්ත පෙළගැස්වීම අනුව තවදුරටත් විමර්ශනය කිරීම්.

6. ශක්තිය හා දුර්වලතා විමර්ශනය කිරීම්.

7. අවස්ථාවන් හා අභියෝග විමර්ශනය කිරීම්.

8. පසුපෙවුම / පසුවිපරම

ක්‍රමවේදය

**ක්‍රමෝපායික සැලස්මක් සකස් කිරීමේදී අනුගමනය කලයුතු** ක්‍රමවේදය පහත දක්වන පරිදි කෙටියෙන් සඳහන් කලහැක.

1. PESTLE Analysis, මෙම විශ්ලේෂණය මගින් දේශපාලන, ආර්ථික, සාමාකිනරිඹ ජීය, තාක්ෂණික, නීති සහ පාරිසරික කරුණු පිළිබඳව විශ්ලේෂණය කරනු ලැබේ.

2. සෙනාරිය විශ්ලේෂණ (Scinario Analysis) : සෙනාරිය හෙවත් සිදුවෙතැයි සිතන තත්වයන් පිළිබඳව සිදුකරන විශ්ලේෂණ මගින් අනාගතයේ සිදුවිය හැකි තත්වයන් පිළිබඳව විමර්ශනය කෙරේ.එය සර්ව සුභවාදී මෙන්ම සර්ව අසුභවාදී තත්වයන් විය හැක.

3. ව්‍යාපාරයේ ආකර්ශන ශීලිත්වය හා ගැනුම්කරුවන්ගේ සැපයුම් කරුවාන්ගේ කේවල්කිරීමේ හැකියාව මෙන්ම ආදේශක භාණ්ඩ හෝ නව නිපැයුම් වෙළෙඳ පොලට පිළිබඳව විමර්ශනය කිරීම.

4. ශ.දු.අ.ත. විශ්ලේෂණය (SWOT Analysis)

5. තුලිත ලකුණු සටහන් පත හා **ක්‍රමෝපායික සිතියම් භාවිතාකිරීම**


**6 . ප්‍රතිචාර ඇගයීම් කිරීම**

## තුන්වන සැසිය

## ව්‍යාපෘති හා ව්‍යාපෘති චක්‍රය

**3.1 හැඳින්වීම**

ව්‍යාපෘති යන වචනය ලතින් භාෂාවෙන් බිඳුණු වචනයක් වන අතර එහි සරල අර්ථය වන්නේ “ කාර්ය්‍යට පෙර” (**before an action**) කලයුතු යන්නයි. ඒ අනුව ව්‍යාපෘතියක් යනු කිසියම් නිෂ්පාදනයක් හෝ සේවාවක් සැපයීමට රජය හෝ රාජ්‍ය නොවන ආයතනයක් හෝ පුද්ගලයන් විසින් කරනු ලබන තාවකාලික මැදිහත්වීමක් ලෙස හැඳින්විය හැක. ව්‍යාපෘතියකින් පවතින තත්ත්වය වෙනස්කිරීමක් අපේක්ෂා කරන අතර එමගින් දැනුම, ආකල්ප හා භාවිතය ඵලදායි අන්දමින් වෙනස් කිරීමට අපේක්ෂා කරනු ලැබේ. එවැනි ව්‍යාපෘතියක් කිසියම් ප්‍රශ්නයක් විසඳීම පිණිස ඉලක්ක කරන අරමුණු හා වැඩසටහන් වලින් සමන්විත වේ. ව්‍යාපාරික සැලැස්මක් නම් නව නිපැයුමක්/සේවාවක් හඳුන්වාදීම හෝ බෙදාහැරීම පිලිබඳ වැඩසටහනක් විය හැක. අරමුණු කෙටිකාලීන මධ්‍යකාලීන හෝ දිගුකාලින වශයෙන් ඉටු කිරීමට අපේක්ෂා කළ හැක. ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීම යනු අවධානමකට මුහුණදීමක් වන අතර. ඒ අනුව පහත දැක්වෙන පරිදි එය කාලය, පිරිවැය හා කාර්යයසාදනය සඳහා සම්පත් කළමනාකරණය කිරීමක් ලෙස අර්ථ දැක්වේ.




පුළුල් අර්ථයෙන් ගත් කළ ව්‍යාපෘතියක් යනු සුවිශේෂී අරමුණක් නිශ්චිත කාලසීමාවක් තුළ ක්‍රියාවට නැංවීමට සකස්කරන ලද විද්‍යාත්මක වැඩසටහනකි. ඒ අනුව ප්‍රතිලාභ අත්කර ගැනීමට විශාල ධන සම්භාරයක් වැය කරන ප්‍රයත්නයක් ලෙස ව්‍යාපෘති හැඳින්විය හැකි අතර එය තෝරාගත් කළාපයක හෝ භූගෝලීය අවකාශයක තෝරාගත් ජන කොටසක් හෝ ඉලක්කගත කණ්ඩායමක් වෙනුවෙන් සකස් කරන්නකි.

ආර්ථික සැලසුම් කරණය හා ව්‍යාපෘති අතර සබඳතාවය විමසා බැලීමේදී සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති අතර රේඛීය සබඳතාවක් පවතින බව පෙනේ. පහත දැක්වෙන පරිදි සැලැස්ම මූලික වන අතර වැඩසටහන් ඊට සම්බන්ධ වේ. වැඩසටහන්වල අනු අංගයක් ලෙස ව්‍යාපෘති සම්බන්ධ වේ. මෙයට උදාහරනයක් ලෙස ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කල මහවැලි මහා සැලැස්ම සැලකුවහොත් එම සැලැස්මේ ප්‍රධාන වැඩසටහන් ලෙස ජල විදුලිබල

නිෂ්පාදනය, වාරි මාර්ග සංවර්ධනය, කෘෂිකාර්මික සංවර්ධනය හා ජනපද ඇතිකිරීම සඳහන් කල හැකි අතර එක් එක් වැඩසටහන් යටතේ විවධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබීය. ජල විදුලිබල නිෂ්පාදනය පමණක් සැලකිල්ලට ගත්විට ඒ යටතේ ක්‍රියාත්මක කල කොත්මලේ, වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ හා මාදුරුඔය ව්‍යාපෘති සඳහන් කලහැකිය. මේ අනුව වැඩසටහන් යනු ක්‍රමෝපායික අරමුණක් තෘප්ත කිරීම සඳහා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති වල එකතුවකි. මෙනිසා වැඩසටහන් කළමනාකරණය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වැදගත් සාධකයක් වී ඇත.

සැලසුම් → වැඩසටහන් → ව්‍යාපෘති

මෙම කරුණු අනුව රාජ්‍ය හෝ පොදු ව්‍යාපෘතියක් යනු දෙන ලද කාලසීමාවක් තුල නිශ්චිත පිරිවැයක් හා අනෙකුත් සීමාකාරිකම් යටතේ ක්‍රියාත්මක කලයුතු එකිනෙකට සම්බන්ධ වගකීම් එකතුවක් ලෙස සැලකේ.

විද්‍යාත්මක හා ව්‍යාපාරික සාහිත්‍යට අනුව ව්‍යාපෘතියක් යනු සුවිශේෂී අපේක්ෂිත ඵලයක් ඉටුකර ගැනීමට ක්‍රියාත්මක කරන පර්යේෂණ හෝ නිර්මාණශීලී සහයෝගිතා ව්‍යාපාරයකි. ඒ අනුව ව්‍යාපාරික ව්‍යාපෘතියක් යනු දැනුම, ආකල්ප හා භාවිතය වෙනස් කිරීම සඳහා ඉදිරිපත් කරන අනන්‍ය නිපැයුමකි.

රාජ්‍ය හෝ ව්‍යාපාරික ව්‍යාපෘති කුමක් වුවත් සෑම වාපෘතියක්ම තාවකාලික ප්‍රයත්නයක් වන අතර එමගින් අවධාරණය කලයුතු කරුණ වන්නේ ව්‍යාපෘති සැලැස්මක් යනු දැක්මක් හා වැඩපිළිවෙලක් සහිත රාජ්‍ය හෝ පුද්ගලික ආයතන හා මූල්‍ය ආයතන අතර ඇති කරගන්නා ගිවිසුමක් බවයි. ඒ අනුව ව්‍යාපාරික සැලැස්ම මගින් පහත සඳහන් මූලික ප්‍රශ්න වලට අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. එමගින් ව්‍යාපෘති දැක්ම හා අපේක්ෂිත ඵලය පැහැදිලිවේ.

අයි?: ව්‍යාපෘතිය මගින් අවධානය යොමු කරන ගැටලුව හෝ අවශ්‍යතාවය කුමක්ද?

කුමක්ද ? : ව්‍යාපෘතිය මගින් සිදු කරන කාර්ය හෝ නිපැයුම කුමක්ද?

කවුරුන්ද ? : ව්‍යාපෘතියට සම්බන්ධ පාර්ශවකරුවන් කවරේද?

කවද්ද? : ව්‍යාපෘතිය ආරම්භ කරන හා අවසන් කරන කාල රාමුව කෙසේද?

**ව්‍යාපෘති වර්ග**

කාර්යයන් අනුව ව්‍යාපෘති වර්ග 04 කි.

1. අත්හදා බැලීමේ ව්‍යාපෘති ( Experimntal Projects)
2. නියමු ව්‍යාපෘති ( Pilot Projects)
3. ප්‍රදර්ශන ව්‍යාපෘති ( Demonstration Projects)
4. නිෂ්පාදන ව්‍යාපෘති ( production  Projects)

අත්හදා බැලීමේ ව්‍යාපෘති මඟින්  විකල්ප ක්‍රමවේදයන් සොයා ගැනීම් සිදු කෙරේ. විවිධ මට්ටම් යටතේ ගැටළු අධ්‍යයනය කර සාර්ථක  හෝ හොඳම විකල්පය ක්‍රියාත්මක කිරීම මෙමගින් සිදු කෙරේ. නියමු හෝ නියාමක ව්‍යාපෘතියක් යනු අත්හදා බැලීම්  ව්‍යාපෘතියකින් සොයා ගන්නා හොඳම විකල්ප ක්‍රමවේදයන් ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නැංවීමයි. අත්හදා බැලීම් හා නිවැරදි කිරීම් අනුව ක්‍රියාත්මක වන නියමු ව්‍යාපෘති සාර්ථක වීමෙන් පසුව ක්‍රියාවට නැංවේ. ප්‍රදර්ශන ව්‍යාපෘති යනු නියමු ව්‍යාපෘති වලම දිගුවකි. එනම් අත්හදා බැලු ක්‍රමවේදයන් ක්‍රියාත්මක කොට  විශාල පිරිසකට පෙන්වීමයි. එමඟින්  නිෂ්පාදන වැඩි කිරීම හෝ ගුනාත්මක භාවය වැඩිකිරීම ප්‍රායෝගිකව පෙන්නුම් කෙරේ. නිෂ්පාදන ව්‍යාපෘති  යනු අවසන් වශයෙන් නිෂ්පාදන කටයුතු සිදු කිරීමයි. එනම් පූර්ණ නිෂ්පාදන මට්ටමට ක්‍රියාත්මක වීමයි.  මෙලෙස  ව්‍යාපෘති  වල කාර්යයන් අනුව ව්‍යාපෘති වර්ග කරනු ලැබුවත් ව්‍යාපෘති වල ස්වරූපය අනුවද ව්‍යාපෘති වර්ග කළහැක. විවිධතාවයකින් යුතු ව්‍යාපෘති හඳුනාගැනීමේදී සලකා බැලෙන  කරුණු 03 කි. i1. යෙදවුම්, 2. නිමවුම් හා 3. සමාජ පිරිවැය හා සමාජ ප්‍රතිලාභ

ව්‍යාපෘති සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා වියදම යෙදවුම් මගින් පෙන්නුම් කරන අතර  එයට බලශක්තිය, අමුද්‍රව්‍යය,  මානව බලය හා මුදල් සම්පත් අයත්වේ. අමුද්‍රව්‍ය කොතරම් අවශ්‍ය ද යන්න ඇස්තමේන්තු කිරීම වැදගත් වේ. ව්‍යාපෘති මඟින් නිෂ්පාදනය කිරිමට අපේක්ෂිත  නිෂ්පාදන හෝ සේවා නිමයුම් වශයෙන් සැලකිය හැක. සමාජ පිරිවැය ,ප්‍රතිලාභ යනුවෙන් අදහස් කරන්නේ ව්‍යාපෘති පරිසරයට හා සමාජයට මෙන්ම ආර්ථිකයට දක්වන දායකත්වය විමසීමයි. මෙම ක්‍රියාවලිය සිදු කිරීමේදී විවිධ පාර්ශවකරුවන් එයට සම්බන්ධ වේ. රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන , මුල්‍ය ආයතන, ප්‍රතිලාභීන් සැපයුම්කරුවන් , උපදේශකවරු හා පාරිභෝගිකයින් මෙයට සම්බන්ධ වේ.

කෙසේ නමුත් ලොව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල ස්වරූපය, ප්‍රමාණය හා වටිනාකම් අනුව ව්‍යාපෘති වර්ග 04 ක් හඳුනාගත හැක.

**1. ඇමෙරිකානු ඩොලර් මිලියන 10,000 ට වැඩි මෙගා ව්‍යාපෘති** (Mega projects which are above $ 10.000 million)

**2. ඇමෙරිකානු ඩොලර් මිලියන 1000-10,000 දක්වා වැය කෙරෙන විශාල පරිමාන ව්‍යාපෘති** (Large scale projects between $ 1000-10. 000 million)

3. **ඇමෙරිකානු ඩොලර් මිලියන 100-1000 දක්වා වැය කෙරෙන මධ්‍ය පරිමාන ව්‍යාපෘති**

(Medium scale projects between $ 100-1000 million)

4 **ඇමෙරිකානු ඩොලර් මිලියන 100 ට අඩුවෙන් වැය කෙරෙන සුළු පරිමාන ව්‍යාපෘති** (Small scale projects less than $ 100 million)

පොදු ව්‍යාපෘති සැලසුම් ක්‍රියාවලියේදී රාජ්‍ය දායකත්වයද වැදගත් වේ. එය ක්‍රම කිහිපයකින් රාජ්‍ය දායකත්වය සිදුවේ.

1 ප්‍රවර්දකයෙකු වශයෙන් රජය ක්‍රියාත්මක වීම. Government as a Promoter)


2.නියාමයෙකු වශයෙන් (Government as a regulato)


3. අධීක්‍ෂකයෙක වශයෙන් (Government as a supervisor)

**ව්‍යාපෘති චක්‍රය**

ව්‍යාපෘති චක්‍රය සැලකූවිට එය ව්‍යාපෘතියක මූලික ක්‍රියාවලි ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ තාර්කික රාමුවක් ලෙස හැඳින්විය හැක. මූලික වශයෙන් එය කොටස් 04 කින් සමන්විත වන අතර එයට ව්‍යාපෘති හඳුනාගැනීම, ව්‍යාපෘති පිළියෙලකිරීම, විමර්ශනය/අනුමැතිය, ක්‍රියාත්මක කිරීම හා අදීක්ෂණය/ඇගයීම ඊට අයත්වේ. මෙම වගුවෙන් පෙන්නුම් කරන පරිදි මෙහි ඇත්තේ චක්‍රීය සබඳතාවයකි. එනම් සරල රේඛීය සබඳතාවයක් නොමැත.

වගු 3.1: **ව්‍යාපෘති චක්‍රය**






මෙහි පළමු අදියර වන්නේ ව්‍යාපෘති හඳුනාගැනීමයි.ගැටළු අධ්‍යයනයක් හෝ අවශ්‍යතා ඇගයීම අධ්‍යයනයක් මගින් ව්‍යාපෘතියට අවශ්‍ය මූලික කරුණු හඳුනාගත හැක. මෙහිදී පවත්නා ආර්ථික, තාක්ෂණික, පාරිසරික හා සමාජයීය කරුණු පිළිබඳව අධ්‍යයනය කළ යුතු අතර ඒ සඳහා හඳුනගැනීමේ පරීක්ෂණයක් කලයුතුය. එමගින් ව්යාපෘතිය ක්‍රියාත්මක වීම මත ඇති වන වාසි හා අවාසි පිළිබඳව තක්සේරුවක් කළ යුතුය. මෙවැනි අධ්‍යයනයකින් ව්‍යාපෘති මගින් එය සම්පත් උපයෝජනය හා පිරිවැය ඇස්තමේන්තුවට පිටුවහලක් වනු ඇත.

මෙහි දෙවන අදියර වන ව්‍යාපෘති සකස් කිරීම මගින් අපේක්ෂා කරන්නේ යෝජිත කාල සීමාවකට අනුව ව්‍යාපෘතියේ වැඩකටයුතු සිදුවන ආකාරය ලේඛනගත කිරීමයි. ඒ සඳහා සක්‍යතා අධ්‍යනයක් කලයුතු අතර එය ද්විතීය හා ප්‍රාථමික දත්ත භාවිතා කිරීමෙන් කල හැකිය. සවිස්තරාත්මක සක්‍යතා අධ්‍යනයක් මගින් ව්‍යාපෘතියේ සක්‍යතාවන් හා සීමාවන් හඳුනාගත හැක. එමගින් යෙදවුම් හා නිමයුම් පිළීබඳව දැන ගත හැකි අතර යෝජිත කාර්යයන් අනුව ඒ ඒ කාලවකවානුවල අවශ්‍ය වන නිමයුම් ප්‍රමාණය ඇස්තමේන්තු කර පිරිවැය ඇස්තමේන්තු කිරීමටද හැකිවේ.

පුළුල් අධ්‍යනයකින් පසුව සකස්වන ව්‍යාපෘති වාර්තාව ඇගයීමකට ලක්කොට මූල්‍ය ආයතන හෝ අරමුදල් ලබාදෙන ආයතනවල අනුමැතිය ලබාගැනීම තෙවැනි අවස්ථාවේදී කලයුතුය. ව්‍යාපෘතිය නිසි පරිදි සකස් වී නොමැති නම් සංසෝධන සහිතව අනුමැතියට ඉදිරිපත් කලයුතුය.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ඊළඟ අදියර වන අතර මෙහිදී සිදු වන්නේ සැලසුම් කල පරිදි ව්‍යාපෘතිය ක්‍රියාවට නංවීමයි. එනම් ව්‍යාපෘතියේ අරමුණු ක්‍රියාවට නැංවීමයි. ව්‍යාපෘති කාර්යාල ඇති කිරීම, නිලධාරීන් බඳවා ගැනීම, උපදේශන හා යටිතල සේවා පහසුකම් ලබා දීම හා ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුවේ. ව්‍යාපෘතිය කළමනාකරණය කිරීම වන අතර ඒ සඳහා පුහුණු කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය. ව්‍යාපෘති කළමනාකරණය සඳහා ගාන්ට් චාට් හෝ ජාල සටහන් ක්‍රම භාවිතා කෙරේ.

ව්‍යාපෘති ප්‍රගති කළමණාකරණය හා ඇගයීම ඊළඟ පියවර වන අතර ව්‍යපෘති ක්‍රියාවලි සිදුවන ආකාරය විමර්ශනය කිරීම හා වාර්තා තබා ගැනීම ප්‍රගති පාලනය තුළින් ඉටු කරන අතර ව්‍යාපාති ඇගයීම මඟින් ව්‍යාපෘති නිසා ප්‍රතිලාභින්ට ඇතිවන බලපෑම හෝ ව්‍යාපෘතියෙන් අපේක්ෂිත වෙනස සිදුවී ඇති ආකාරය සොයා බැලේ. ව්‍යාපෘතිය කරන අතරවාරයේ එනම් කෙටිකාලයේ කරන ඇගයීම් මඟින් ව්‍යාපෘති අපේක්ෂිත ගැටළුව හෝ අරමුණු ඉටු කිරීමට දක්වන දායකත්වය පැහැදිලි කරන අතර ව්‍යාපෘතිය අවසානයේ එනම් දිගුකාලයේදී සිදු කරන අධ්‍යනය මගින් ව්‍යාපෘති නිසා ප්‍රතිලාභින්ට, සමාජයට හා පරිසරයට සිදු වී ඇති බලපෑම පිළිබඳව විමර්ශනය කෙරේ. එහි ප්‍රථිඵල ධනාත්මක මෙන්ම ඍණාත්මක බාහිරතා ඇතිකරන ඒවා විය හැක. එම තත්ත්වය සැලකිල්ලට ගෙන නැවත ව්‍යාපෘතිය සකස් කිරීම, වෙනස් කිරීම, කළ හැක. මේ අනුව ව්‍යාපෘති චක්‍රය ඉහත ක්‍රියාවලි අතර චක්‍රිය සම්බන්ධයක් පෙන්වයි.